

# ගෞතම කේන්ද්‍රය

## සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ

## උත්පැත්ති කේන්ද්‍රය

# ගෞතම කේන්ද්‍රය






වෙසඟය පුර පසළොස්වක යෙදී විසා
දවසය එකුජ සඳු හෝරා කටක ර.සා
උපතය දිවා මුනි ලද දැක මෙගහ ර.සා
බල තුය පඩිනි මෙය සිය නෙත් හැර විමසා

# ගෞතම බුදු රජාණන් වහන්සේගේ

# උත්පත්ති කේන්ද්‍රය

—— // ——

කලියුග වර්ෂයෙන් වෙසක් මස පුර පසළොස්වක ලත් කුජ දින දිවා කාලයෙහි කටක ලග්නය සම්බන්ධ විසා නැකතින් ගෞතම බුදු රජාණන් වහන්සේ මෙලොවට පහළවූ සේක. බුදුන් වහන්සේ මෙලොවට පහළවූ කාල වේලාදිය ගැන පූජ්‍යාචාරීවරයන් විසින් මෙහි පහත දක්වන ශ්ලෝකයෙන් සහ කවියෙනුත් කේන්ද්‍රකර ප්‍රකාශ කොට තිබේ.


වෛශාඛෙ මාසිරාධේ‍ය ක්ෂිතිසුත දිවසෙ ගීෂ්පතීසේථ කුලීරෙ
මීනෙ ශුක්‍රෙ සසෞම්‍ය දසසත කිරණෙ මෙෂගෙ ව්‍යෝමමධ්‍යෙ
පූර්ණේ චන්ද්‍රෙ තුලායාම පරදිසි මෘගෙ මඛගලෙ කුම්භගෙ කේතෞ
සර්වඥඃ සර්ව වන්ද්‍යඃ කිලක පිල පූරෙ ජාතවාන් ශ්‍රී මුනීන්ද්‍රඃ

**මෙහි සිංහල කවිය**

වෙසඟ මගුල් දින පසළොස් කටක ගු — රූ
තිසඟ සොමි සිකුරු අජරුස පලග හි — රූ
සසක තුල මූවර කුජ කුම්භ සෙහසු — රූ
මෙලෙස උපනි සත ගෑන දෙස තිලෝගු — රූ

වෛශාඛෙ මාසෙ වෙසක් මස අර්ධ අර්ධයෙහි: ක්ෂිතිසුත දිවසෙ; අඟහරුවාදා දවසෙහි; කුලීරෙ කටක ලග්නයෙහි; ගිෂ්පතිසේථ බ්‍රහස්පතී සිටි කල්හි; ශුක්‍ර සිකුරෙ; මීනෙ, මීන රාශියේ සිටි කල්හි සසෞම්‍ය; බුදුහු සහිතවූ; දසසතකිරණෙ, හිරු; ව්‍යෝමමධ්‍යෙ, ආකාශ මධ්‍ය ගතවූ? මෙෂගෙ, මේෂ රාශියට පැමිණි කල්හි; තුලායාං තුලාවෙහි; පූර්ණ චන්ද්‍රෙ පූර්ණ චන්ද්‍රයා සිටි කල්හි; අපරදිසි, අපර දිශාවෙහි මෘගෙ මකර යෙහි; මඛගලෙ, අඟහරුවා සිටි කල්හි අග්‍රෙ, සෙනසුරා කුම්භගෙ, කුම්භ රාශියට පැමිණි කල්හි; සර්වඥඃ සියල්ල දත්තාවූ; සර්ව වන්ද්‍යඃ සියල්ලන් විසින් වැන්ද යුතුවූ ශ්‍රී මුනීන්ද්‍රඃ මුනීන්ද්‍රවූ ගෞතම සර්වඥයන් වහන්සේ කපිල පුරෙකිල, කපිල වස්තු පුරයෙහි; ජාතවාන් උපන් සේක යනු ශ්ලෝකයෙහි; හා කවියෙහිත් පදගත සත්තයයි.

# ගෞතම බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රය




මෙම කේන්ද්‍රයෙහි ග්‍රහයින් යෙදී තිබෙන්නාවූ පිළිවෙළට සෑදෙන යෝග හා ඒ යෝගවල ගුණ පූර්වාචාරීවරයන් විසින් ප්‍රකාශ කොට තිබෙන අන්දම මෙහි පහත දක්වනු ලැබේ.

ගුරු ග්‍රහයා හෙවත් බ්‍රහස්පතී කටක රාශියෙහි උච්ච ක්ෂෙත්‍රව බලයෙන් යුක්තව යෙදුනි නම් ගුරු හංස යෝගය නම්වූ යෝගයක් යෙදෙන බැවින් ඊට ඇතිවන ගුණ මෙහි පහත දක්වන ශ්ලෝකයෙන් ප්‍රකාශ වේ.

ශාස්ත්‍රාර්ථ විත් බහු යසඃ පරමාර්ථ යුක්තඃ
පුත්‍රාන්‍යපාන කුසුමාම්බර පූජ්‍ය කර්මං
කන්දර්ප රූප නිපුණෝ ගුරු හංස යෝගෙ
තස්‍යායුෂෝ භවති රබ්ධ වසීති සිඬඃ

ශාස්ත්‍ර දැනගැනීම බොහෝවූ සම්පත් ලැබීම උතුම්වූ ක්‍රියාවන්හි යුක්තවීම දරුවන් ඇතිවීම ආහාර පාන වර්ගාදිය ලබන්නෙක්වීම මල් පූජාකිරීම ආදී පින් කරන්නෙක් වීම යහපත් වස්ත්‍ර ලබන්නෙක් වීම අනඞ්ගයාගේ රූප පරදන්නාවූ රූප ලක්ෂණ ඇත්තෙක් වීම සහ අසූ අවුරුද්දක් ආයුෂ වළඳන කෙනෙක්ද වේ යනු මෙහි අදහසයි.

මේ ශ්ලෝකය ජාතක රත්නයෙහි කවිකාර තිබෙන්නේ මෙසේය:-

සිව්යත දශ ජන්මය ගුරු යෙදූ නා
ඇවි සිරි විඳ පිරිවර ලැබ යේ නා
දෙව් පිය දන සම්පත් රජ කරු නා
කවි ගුරු හස යෝගය ලද සිරි නා

ගෞතම් බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි මෙම ග්‍රහ යෝගය ඇතිව තිබෙන බැවින් මෙම ශ්ලෝකයෙහි සහ කවියෙහින් සඳහන්ව තිබෙන සියළුම ගුණ ධර්ම උන් වහන්සේට ඇතිවූ බව ඇත ගිහිගෙයි විසූ විසිනව අවුරුද්දත් වනගතව වාසය කළාවූ සය අවුරුද්දත් බුදුව වැඩ සිටියාවූ හතලිස් පස් අවුරුද්දත් එක්කොට බැලූ කල සම්පූර්ණයෙන් අසූ වසක් ආයු වැළඳූ බවත් මනා කොටම දැනගත හැකිව තිබේ.

පෘථුභට බලවන්තාඃ රාග වෙෂාඃ බලෙන
අවනිපති කල ශත්‍රෲ භූමි ලාභං විසෙසාත්
ධනපති වර්ත්‍යාගී රාක්ෂ භූතාන මධ්‍ය
රුචක නිහිති බන්ධුඃ නන්දනෙ ආයුවුර්ධිඃ

මෙහි සිංහල කවිය

සතර සතන් දස ජමමය ලෝගි න
සතර මහත් දිව තෙදබල පූජි න
පතර වසතු දස මිරුවින් බිය නැ න
සතර දීප ජය රුචක යෝග මෙ න

මෙම ශ්ලෝකයෙහි හා කවියෙහිත් ප්‍රකාශව තිබෙන අන්දමට උත්පැත්ති කටක රාශිය කෙරෙන් සත්වෙනිවූ මකර රාශියෙහි අඟහරු යෙදුනි නම් රුචක නම්වූ යෝගයක් ඇති වන බැවින් මේ යෝගය ඇතිව උපන් තැනැත්තා රජෙක්වීම වීර්යවත් පුද්ගලයෙක් වීම රාගාදී කෙලෙස් සිත් මැඩ පවත් වන්නෙක් වීම වෙන්ව නොයන්නාවූ සෙවන් අත් හිමියන් පාමා නාගන්නාවූ සත්‍රියක් ලැබීම රට රාජ්‍ය භූබ තබම ආදිය ලබන්නෙක් වීම වස්තු ස්වාමියෙක් වීම, ත්‍යාගී වන්තයෙක් වීම, යක්ෂ රාක්ෂසාදීන්ගේ මධ්‍යයට පැමිණුනත් ඔවුන් මැඩ පවත්වා ජය ලබන්නෙක් වීම යනාදී ගුණ ඇත්තෙක් වන බව පෙනේ. මෙම ග්‍රහ යෝගයත් ගෞතම බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි යෙදී තිබෙන බැවින් උන් වහන්සේ මෙහි කී සියළුම ගුණ ධර්මවලට හිමි කෙනෙක්ව විසූ බව සහ ආලවකාදී යක්ෂයින්ද වසවත් මාරු ආදී දේවතාවුන්ද අංගුලි මාලාදී රළු පුරුෂයින්ද දමනය කල බැවින්යක් රකුසන් තමන් කරා පැමිණුනත් ඔවුන් මැඩ පවත් වන්නාවූ කෙනෙක් වෙනවාය යයි පූර්ව චාරීවරයන් විසින් ප්‍රකාශ කොට තිබෙන නියමිතත් යස රුවට සමරවූ බැව් දත යුතුය.

බ්‍රහස්පති කටක ලග්නයෙහි උච්ච ක්ෂෙත්‍රව යෙදුනි කුලීරනම්වූ යෝගයක් යෙදෙන බව සහ මෙම යෝගය යම් කෙනකුගේ කේන්ද්‍රයෙහි යෙදුනි නම් ඒ ඇත්තාට ඇති වන්නාවූ ගුණ පූර්ව චාරීවරයන් විසින් ප්‍රකාශ කොට තිබෙන්නේ මෙසේය.

ජීවඃ කුලීර සහිතෝපිච කණ්ඨ කසෙථ
භෝගාන්විතෝ සුධන මෞක්තික පද්මරාගං
ලබ්ධං සුභූතීත්‍ය වරවාහනරඞ්ග නාභිඃ
ජාතඃ පලානිධ කුලීරහිඩාන යෝගෙ

## මෙහි සිංහල කවිය

| | | |
|---|---|---|
| විස්තර දූසිදස්ගව කෙත් | බෝග | ය |
| රුස්කර මිනිමුතු පද්ම | එරාග | ය |
| පස්මරු මත් සිදි මේ ගුණ | බෝග | ය |
| දිස්නය සඳ සරි කුලීර | යෝග | ය |

මේ ශ්ලෝකයෙහි හා කවියෙහිත් අදහස නම්:- කුලීර යෝගය ඇතිව උපන් තැනැත්තා දසි දස කෙත්වත් ගව මහිෂාදී බොහෝ වස්තු ලබන්නෙක් වීම නානා ප්‍රකාර මුතු මැණික් වෛඩූර්‍යාදිය ලබන්නෙක් වීම උතුම්වූ යාන වාහනාදිය බලන්නෙක් වීම සහ පස්මරුන් පරද වන්නාවූද කෙනෙක් වේ. යනුයි මෙම ග්‍රහ යෝගයන් භාග්‍යවත් බුදු රජාණන් වහන්සේගේ ක්ෂේත්‍රයෙහි යෙදී තිබෙන නිසා උන් වහන්සේ මෙහි කී ගුණ ධර්මවලට හිමි කෙනෙක්ව උපන් බව සහ ස්කන්ධ ක්ලේශ අභිසංස්කාර මූර්ත දේව පුත්‍ර මාර යන පස් මරුන් පරදවා ජයග්‍රහනය කල බැවින් පස් මරුන් පරදවන කෙනෙක් වෙනවාය යන කියමනද වැඩි වශයෙනුත් සපිර බැව් දත යුතු.

තලස්‍යා මන්ත්‍රීයුතෝරාශ්ටෝ අතෝන්‍යාදශේව රෝජනඃ
දිශ්වෞජනා සුඛා යුක්තෝ ජය සිද්ධාඪ්‍ය යෝගදඃ

## මෙහි සිංහල කවිය

| | |
|---|---|
| කටකය ගුරු දෙව් යෙදුනොත් නිම | ලා |
| පිට රට සම්පත් වස්තුව ලබ | ලා |
| දුටු සත මිතුරුම් කල්යෙනී සහ | ලා |
| රට සිය ජය සිදු යෝගය තෙප | ලා |

බ්‍රහස්පතී ග්‍රහයා කටක රාශියෙහි උච්ච ක්ෂෙත්‍රව යෙදී තිබෙන නිසා ජය සිද්ධාර්ථ යෝගය නම්වූ යෝගයක් ඇතිවන බැවින් බොහෝ වස්තු ලබන්නෙක් වීම දුටුවන් නෙත් සිත් ප්‍රිය කරන්නාවූ කෙනෙක්ව සැපසේ කල් යවන්නාවූ කෙනෙක් වන බව මෙම ශ්ලෝකයෙන් සහ කවියෙනුත් ප්‍රකාශ වන්නේය.

උත්පත්ති කටක රාශිය කෙරෙන් නව වැනිවූ මීන රාශියෙහි උච්ච ක්ෂෙත්‍රව සිකුරා යෙදීමෙන් මහෞෂධ නම්වූ යෝගයක් යෙදෙන බව සහ ඒ යෝගය යම් කෙනෙකුගේ ක්ෂේත්‍රයෙහි යෙදුනී නම් ඔහුට ඇතිවන ගුණ පූර්වාචාර්යවරයන් විසින් ප්‍රකාශ කර තිබෙන්නේ මෙසේය.

විස්තීර්ණං උරු බාහුං කමල මෘදු තනුඃ උච්ඡිකෝෂාවපානී
ස්ථූලංකණ්ඨ පඩ්ගා බහුලධන ශ්‍රුති ශාස්ත්‍රවිත් පූජ්‍ය කීර්තිං
විශ්‍රීං ප්‍රඥ යශ ශ්‍රී සුජන පරිවෘජං පුත්‍ර මිත්‍රංච බන්ධූ
වෛශ්‍යා ලෝකාංචර වර ධනලභතෙ සුඛ උච්චෛව යුක්තම්

### මෙහි සිංහල කාව්‍ය

මීනය සිටියොත් කිවිඳු ළිඳුක ර
මෘත අඞ්ග ලක්ෂණ ගුන රුබ ර
ඥන උතුම් කිම් ලබ දන විසිතු ර
තෘත යෝග මව් සඳහම කී පෙ ර

පුළුල්වූ අත් පා ඇත්තෙක් වන බව මෘදු මොලොක් ශරීරය ඇත්තෙක් වන බව උඩුකුරුව ශියවූ හිසකේ ඇත්තෙක් වන බව ස්ථූලවූ ග්‍රීවය හා පාද අත්තෙක් වන බව බොහෝ වස්තුව හා සැප ඇත්තෙක් වන බව ශාස්ත්‍ර දන්නා කෙනෙක් වන බව පින් කම් කරන්නෙක් වෙන බව වී. කී වන්තයෙක් වන බව ප්‍රඥ වන්තයෙක් වන බව යහපත් යන් පුරුෂයන් භජනය කරන්නෙක් වන බව පින්වත් දරුවන් ලබන්නෙක් වන බව මිතුරන් හා හැයන් ලබන්නෙක් වන බව සහ සියළු ලෝකයා නමා වයනයෙහි නසුරු වන්නාවූ කෙනෙක් වන බවද මෙම ශ්ලෝකයෙහි සහ කවියෙහිත් ප්‍රකාශව තිබේ ඝේය මෙම ග්‍රහ යෝගයත් බුදු රජාණන් වහන්සේගේ ක්ෂේත්‍රයෙහි යෙදී තිබෙන බැවින් උන් වහන්සේ මෙහි කී සියලුම ගුණ ධර්මවලින් හිමියෙක්වූ බව දත යුත්තේය.

අටවෙනිවූ කුම්භ රාශියෙහි සෙනසුරු යෙදුණු කම ජය යෝගය නම්වූ යෝගයක් යෙදෙන බැවින් මෙම යෝගය ඇතිව උපන් ඇත්තාට ඇති වන්න වූ ගුණ පූර්වාචාර්යවරයන් විසින් ප්‍රකාශ කර තිබෙන්නේ මෙසේය

ස්වාකී සුතු පුත්‍රස්ස නරේන්ද්‍රං භජිතවරං
මන්ත්‍රී භාවංච මිත්‍රස්ස ශ්‍රී භූතෝයෝග පාර්වතඃ

### මෙහි සිංහල කවිය

පිරි කුඹු සැනි දෙව් සිටියොත් නිම ලා
සිරි මහ රජගෙන් තනතුරු ලබ ලා
ගිරි පිට ගෙවළුන් අනුමැති වීපු ලා
වරි ගෙට ජයමෙයි වෙසෙසින එකු ලා

රජුන් ආදී මැදගත් අය ඇසුරු කරන්නෙක් වීම රජ බව ආදී උතුම් තනතුරු ලබන්නෙක් වීම උස් ඉඩම්වල පිහිටි ප්‍රාසාදාදිය ලබන්නෙක් වීම යනාදී ගුණ ඇත්තෙක් වන බව මෙම ශ්ලෝකයේ හා කවියෙහිත් අදහසවේ. මෙම ග්‍රහ යෝගයත් බුදු රජාණන් වහන්සේගේ ක්ෂේත්‍රයෙහි යෙදී තිබෙන බැව් දත යුතුයි.

කටක රාශි කෙරෙන් දසවැනිවූ මේෂ රාශියෙහි රවි බුධ යන ග්‍රහයින් දෙදෙනා යෙදුන හොත් රවි බුධ නම් යෝගයක් යෙදෙන බැවින් මෙම යෝගය ඇතිව උපන් ඇත්තාට ඇති වන්නාවූ ගුණ පූර්ව චාරීවරයින් විසින් ප්‍රකාශ කර ඇත්තේ මෙසේය.

අකීර්ඥයොග යුක්තා රමිත ජනවරශ්‍රමාවරා භූමරා
ලබ්ධො නෙක වසුන්ධ රාති රජාතා දීර්ඝායු ලාභං ගතෙ

මෙහි සිංහල කාව්‍ය

ගුරුන් බුදුහු සිටියොත් එක බව තේ
තොරත් නැතුව මුළු දෙරනත් වරු තේ
පිවිතුරු සම්පත් නිරතුරු පැමි තේ
රවි බුධ යෝගය පලමේ ලෙසි තේ

වන් සඳ රවි බුධ යෝගය එලෙ සේ
ගත් බිම් වස්තුව අන මිට බෝ සේ
පත් සියසෙත් ලැබ දිග තුල සැප සේ
මත් තොස කරවති දූ දරු දන සේ

උත්තමයෙක් වීම උතුම් ගම්වල වාසය කරන්නෙක් වීම රන් රිදී ආදී නොයෙක් ධන ලබන්නෙක් වීම පින්වත් දූ දරුවන් ලබන්නෙක් වීම යනාදී ගුණ ඇත්තෙක් වන බව මෙම ශ්ලෝකයෙහි හා කවියෙහිත් සඳහන්ව තිබේ.

බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි මෙම ග්‍රහ යෝගයත් ඇතිව තිබෙන බැවින් උන් වහන්සේ මෙහි කී ගුණ ධර්මවලට ද හිමිවූ කෙනෙක් විය බුද්ධත්ව දූ දරුවන් කොයින්ද යන සැකයක් ඇතැම් අයගේ සිත්වල ඇතිවිය හැකියි. ගිහිගෙහි වාසය කළා නම් ගෘහස්ථ දූ දරුවන් ලබන්ට හැකිව තිබුන නිසා සහ බුදුව විසූ කාලයෙහි ඇතිවූ භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුනීන් වහන්සේලාත් දරු සංඛ්‍යාවට ඇතුලත් විය හැකි බැවින් එසේ සැක නොකට යුත්තේය.

ලග්නයෙහි ගුරු ද හතරේ චන්ද්‍රයා ද හතේ අඟහරුවා ද දහයේ රවි බුධ දෙදෙනා ද කේන්ද්‍ර ගතව යෙදුනි නම් පර්වත නම්වූ යෝගයක් යෙදෙන බැවින් මෙම යෝගය ඇතිව උපන් ඇත්තාට ඇතිවන ගුණ පූර්ව චාරීවරයන් විසින් ප්‍රකාශ කර තිබෙන්නේ මෙසේය.

උදයාස්තගතෙ කමේ ශිබුකෙග්‍රහ සංයුතෙ
සහජව්‍යය සංයුක්තෙ පර්වත යොගෙන උච්‍යතෙ

මෙහි ගුණ

ලෝක අති කීර්තිංච විනිත්තන්ත ගුණනිකෙතඃ

රජ බව ප්‍රධාන කොට ඇති වස්තු නායකයෙක් වීම යහපත් කීර්ති ප්‍රශංසාදිය ලැබීම පතලවූ ගුණ ඇත්තෙක් වීම යනාදියයි මෙම යෝගයත් බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි යෙදී තිබෙන බැව් දත යුතුයි.

සත්වෙනිවූ මකර රාශියෙහි අඟහරු යෙදීමෙන් සතර දීපජය යෝගය නම්වූ යෝගයක් යෙදෙන බැවින් ඒ යෝගය යම් කෙනෙක් හට ඇතිවුනි නම් ඔහුට ඇතිවන ගුණ මෙහි පහත දක්වන ශ්ලෝක පාඨයෙන් සහ කවියෙනුත් ප්‍රකාශ කර තිබෙන්නේ මෙසේය.

රක්තාඞ්ගෝ මකරේ ස්‍යාජිත ජිතා ශාස්ත්‍රාදී දීර්ඝාධරඃ

මෙහි සිංහල කවිය

රතඟ මකර ලග්නය සිට තුන් ගා
පතර සතර අත් දනිති නොසං ගා
කිතර සෙඟග පිරිවර ජය රන් ගා
සතර දීප ජය යෝග සිරින් ගා

උස්වූ ශරීරය ඇත්තෙක් වීම ශාස්ත්‍රාර්ථ දැනීමෙන් පතලවූ ගුණ ඇත්තෙක් වීම නිරතුරුවම ජය පිරිසක් ඇසුරු කරන්නාවූ කෙනෙක් වීම යනාදී ගුණ මෙම ශ්ලෝකයෙහි හා කවියෙහිත් අදහසයි මෙම ග්‍රහ යෝගයත් බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි ඇතිව තිබේ.

දසවැනිවූ මේෂ රාශියේ හිරු යෙදීමෙන් මයුරපාල නම්වූ යෝගයක් යෙදෙන බැවින් ඒ ග්‍රහයෝගය යමෙකුට ඇති උනි නම් ඒ ඇත්තාට ඇති වන්නාවූ ගුණ පූර්ව චාරීවරයන් විසින් ප්‍රකාශ කොට ඇත්තේ මෙසේය.

අකීර්ජේෂභූත තාගාඃ දයයසනධාරා තාතා විචිත්‍රාධරාඃ

මෙහි සිංහල කවිය

පතර පතඟ එළු රැස උව සහ සා
සතර දෙපදනයන් ඇසින සා
නිතර ම ලැබ ගම් නෙත්වන් එරූ සා
මයුර පාලි යෝගයට මෙ පිල සා

දැසි දස සොත්වක් ගව මහිෂි ඇත් අස් යාන වාහනාදී නන් වැදෑරුම් වස්තුව ලබන්නාවූ උත්තමයෙක් වන බව මේ ශ්ලෝක පාඨයෙහි සහ කවියෙහිත් අදහසයි. මෙම ග්‍රහ යෝගයත් බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි යෙදී තිබේ. බුදු රජාණන් වහන්සේට ඇත් අස් යාන වාහනාදිය තිබුනා දැයි සමහර අයට සැක කළ හැකියි. ගිහි ගෙය හැර නොගොස් මහනවී බුදු බව අවබෝධ නොකළා නම් සත් දවසින් සක්විති රජවීමට හිමිව උපන් පුණ්‍යවන්ත උත්තමයා යථෝක්ත සැප සම්පත් නොලබා දැයි කල්පනා කිරීමෙන් ඒ සැක සිත් විනෝදනය කර ගත යුතුයි.

අරුණකර දිවාකරෝ මෙෂ චාපෙව මීනෙ
ලභති බහු කලත්‍රෛ රූප කන්‍යා ලභන්තෙ
අතිධවල විචිත්‍රා වස්ත්‍ර භොගානු ධාන්‍යා
සන්ති භූපති ප්‍රිෂෙටා බන්ධූ ස්තෝති තස්‍ය

ධනු රාශිය, මීන රාශිය, මේෂ රාශිය යන මේ රාශිවල ගුරු යෙදුනි නම් අති විසිතුරු වස්ත්‍ර ලබන්නෙක් වීම රන් රිදී මැණික් ආදී වස්තුව ලබන්නෙක් වීම මා ගැහි රූපශ්‍රීයාවෙන් යුත් ස්ත්‍රීන් ලබන්නෙක් වීම හිතේෂි ඥාති සමූහයක් ලැබීම යනාදි ගුණ ඇති වන බව මේ ශ්ලෝකයෙහි ප්‍රකාශව තිබේ. මෙම ග්‍රහ යෝගයන් බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි යෙදී තිබෙන බැව් දත යුතුයි. බුදු රජාණන් වහන්සේට ස්ත්‍රීන් සිටියා දූසි සමහරු වාදයක් ආරෝපනය කල හැකියි. බුදු බවට පැමිණීම පිණිස මහා භිනිෂ් ක්‍රමනය කරන්ට ප්‍රථම යශෝදරා දේවිය ඇතුළුවූ දහස් ගණනක් බිසෝවරු සිටි නිසා ඒ වාදය අත්හැර දැමිය යුතුයි.

දෙව බ්‍රාහ්මණ සාධු පූජනරතිඃ ප්‍රඥඃ ශුචිඃ තෙජිතඃ
ප්‍රාං සුමුන්තන භාසිකඃ ක්‍රසවලඃ ගාත්‍රොව නෙචාන්විතඃ
ගීතඥඃ ක්‍රිය විත්‍රියෙව කුසලා දෙවෙවතා මා සරුග්
බන්ධූ නාමූපකාරකඃ විකසිතඃ සන්න්‍යස්ත තෙනසජනගෙ

සඳු ග්‍රහයා සත් වැනිවූ තුලා රාශියෙහි සිටින නිසා දිව්‍ය බ්‍රහ්මාදී උත්තමයින්ගෙන් වැඳුම් පිදුම් ආදී ගරු බුහුමන් ලබන්නාවූ කෙනෙක් වන බව මේ ශ්ලෝකයෙහි සඳහන්ව තිබේ. බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි මෙම ග්‍රහ යෝගයන් ඇතිව තිබෙන බැවින් උන් වහන්සේ

බ්‍රහ්මාච ලොකාධිපති සහම්පති
කතඤ්ජලී අනධිවරං අයාචථ
සඤ්ඤබග්නතං අප්ප රජක්ඛ ජාතිකං
දෙසෙථ ධම්මං අනුකම්පිමං පජං

යනාදී ගාථාවලින් ප්‍රකාශ වෙන අන්දමට ප්‍රථම ධර්ම දේශනාව පිණිස මහා බ්‍රහ්ම රාජයා විසින් බඩාඤ්ජලීව ආරාධනා කිරීමෙන් දිව්‍ය බ්‍රහ්මාදී උත්තමයින්ගෙන් ගරු බුහුමන් ලබන්නාවූ කෙනෙක් වෙනවාය යන කියමන සැබවින්ම ස්ථිර වන්නේය.

කිංකුර්වන්ති ග්‍රහාඃ සර්වේ චන්ද්‍ර කෙන්ද්‍රෙ බෘහස්පතෙ
ගජවල සහස්‍රානි මධ්‍යෙ සැරිථා

චන්ද්‍ර කේන්ද්‍රයෙහි හෙවත් ලග්නයෙහි බෘහස්පති යෙදුනි නම් අනික් ග්‍රහයින්ගෙන් කරනක් නැත. ඒ ඇත්තා හස්ති රාජයන් මැදට පැමිණියාවූ කේසර සිංහ රාජයෙක් මෙන් විරාජමාන වන්නේය. යනු මේ ශ්ලෝකයෙහි අදහසයි. මෙය ජාතක රත්නය නම් පොතේ සවි කර තිබෙන්නේ මෙසේය.

ගු රු  දෙව් ජම්මය සිටියොත් සතහ  ව
දු රු  සම්පත් ගවසින් ඇත බැඹි කො  ව
ස රු  ඇති ගම් සතරැස් ගෙවලුත් තු  ව
බෝරු  තැන පවසම් සුබ උච්චය දු  ව

මාන්‍යඃ සර්ව ජනෛර් ද්‍රුතම් විස්තු ග්‍රහ තත්පරඃ
භොගි ධම් පරඃ ශ්‍රීමාන් බහු ඥානෙත්‍යා විචක්ෂණඃ

තුලා රාශියෙහි සඳු යෙදුනි නම් එකාන්තයෙන් සියල්ලන් විසින්පිදිය යුතු අයෙක් වන බව නුවනැත්තෙක් වන බව මේ ශ්ලොකයෙ හිසක කවියෙහින් අදහසයි මේ ග්‍රහ යෝගයෙන් යෙදී තිබෙන බැව් දත යුතුයි.

ගුරු රුඩුපති ශුක්‍රෞ සූර්‍ය්‍ය හෞමෞ වම්මගො
විබුධ පිතෘනි රස්මෞ නාරකීනාංශ්ච කුයුති:
දීනකට සසි වීර්‍ය්‍යඃ තිෂ්ටි තත්‍ය‍ං සත්‍යා‍ඃ
ප්‍රවර සමති කාශ්ටාස් තුඞග භුෂාදනුතො

ගුරු සඳු දෙදෙන වීර්‍ය්‍යාධිකව බලවත්ව සිටියාහු නම් කටක ලග්නයෙහි තුන්වන දෙස්කානාධිපතිවූ ගුරු උච්චක්ෂෙත්‍රව ලග්නයේ සිටියේ නම් දෙව්ලොවින් මිනිස්ලොවට ආ කෙනෙක් වෙන බව මේ ශ්ලොකයෙහි සඳහන්ව තිබේ බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි මෙම ග්‍රහ යෝගයත් යෙදී තිබෙන බැවින් පාරමී ධම් පූර්ණ කිරීමෙන් තුසිපුරනම් දෙව්ලොව ඉසිද වාසයකට බුදුවීම පිණිස මිනිස් ලොවට ආ බව මනා කොට ස්පිර වන්නේය.

ඝටෙශ්වම කණ්ටකගො ගුරු රුච්චෞ හවති මීක ලග්නෙවා
ශෙෂෛ රබලෙජිත්මති මරනෙවා මොක්ෂගති මානුඃ

බ්‍රහස්පතී උච්ච ක්ෂෙත්‍රව කේන්ද්‍ර ගතවී ලග්නයෙහි සිටියේ නම් අනික් ග්‍රහයින් ඊට අඩුව සිටියාහු නම් ඒ ඇත්තා මරනින් පසු නිවන් දක්නා උත්තමයෙක් වෙන බව මේ ශ්ලොකයෙන් ප්‍රකාශවේ. බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි මෙම ග්‍රහ යෝගයත් ඇතිව තිබෙන බැවින් උන් වහන්සේ නිවන් දුටු උත්තමයෙක් බව මනා කොට ඔප්පු වන්නේය.

සතරාමර ලෝකෙක දිවාකරවූ භාග්‍යවත් ගෞතම බුදු රජාණන් වහන්සේගේ කේන්ද්‍රය සම්බන්ධ තවත් වැදගත් කරුණු බොහෝ රාශියක් කිව හැකි නුමුත් පොත විශාල වන බැවින් මෙපමණකින් නවත්වමි. මෙහි දක්වූ කරුණු වලිනුත් මූන් වහන්සේ ඇදහිය යුතු උතුම කෙනෙක් බව නුවනැති කාටත් නො වැටහේයයි නොසිතමි.

යම් කෙනෙක් උපදින කල ග්‍රහයින් පස් දෙනෙක් තම තමන්ට අයිති උච්චක්ෂෙත්‍රවල සිටියොත් ඔහු නම් රජ කුලයක උපන් තැනැත්තෙක් නම් චක්‍රවර්ති රජෙක් වෙයි. ග්‍රහයින් තුන් දෙනෙක් උච්චක්ෂෙත්‍ර

යන්හි සිටිද්දී යම් කෙනෙක් උපන්නොත් හෙතෙම රජ දරුවෙක් නම් රජවෙයි. අවශේෂ කුලයක දරුවෙක් නම් අමාත්‍යයෙක් හෝ ජනාධිපතියෙක්වේ යයි ද මිට පංච මහා පුරුෂ යෝගය නම් යෝගයයි කියන බවද මෙහි පහත දක්වන ශ්ලෝකයෙන් ප්‍රකාශ වන්නේය.

ඛෙටාඃශ්ච පවති ජොවිච සංස්ථාඃ
සසාජි හෞමඃ බලු යසස්‍යුතො
ත්‍රිභිඃ සවතුබෙගාප ගණෙනඃ සරාජා
නෘපාල බාලොක්‍ය ශ්‍රුතස්තු මන්ත්‍රි

මෙය ජාතක රත්නයෙහි කවිකාර තිබෙන්නේ මෙසේය.

බුද මිගි පුත් සැනි ගුරු කිවි පස් දෙ    න
ලද තුඟු රැස් එක සිව් සත් දසව    න
යෙදුනම පස් මහ පුරුෂ යොගව    න
වදනකි පෙර පඩි පැවසූ මෙලෙසි    න

මෙම කවියෙන් සහ ශ්ලෝකයෙන් ප්‍රකාශ වන පංච මහා පුරුෂ නම් ග්‍රහ යෝගයන් සර්වඥයන් වහන්සේගේ ජන්ම පත්‍රයෙහි යෙදී තිබෙන බැවින් උන් වහන්සේ යථෝක්ත ගුණ ධර්ම යන්ට හිමි කෙනෙක්ම උපන් බැව්ද දත යුත්තේය.

යමෙකුගේ උත්පැත්ති කාලයෙහි බ්‍රහස්පති උච්චක්ෂේත්‍රවයෙහි හෝ සතර කේන්ද්‍රයෙන් එකක නොහොත් බ්‍රහස්පති උච්චක්ෂේත්‍රයවූ කේන්ද්‍රයෙන් එකකවූ කල සිකුරු නව වැන්නේ සිටීම හේතු කොට ගෙණ උපන් තැනැත්තාගේ මුද්දර (ජය ලේඛනය) ඒකාන්තයෙන් සාගරය හිමි කොට බබලන බව සහ බ්‍රහස්පති කටකයෙහිද සඳු සමග හිරු ධනුවෙහිවූ කලද බුදහු උච්චක්ෂේත්‍රයෙහි (කන්‍යාවෙහි) සිටීම හේතු කොට හෝ උපන් තැනැත්තා සාගරය හිමි කොට රජෙක් වෙන බවත් භාව කුතුහලයෙහි සඳහන්ව තිබෙන මෙහි පහත දක්වන ශ්ලෝකයෙන් ප්‍රකාශ වන බව සහ මෙම ග්‍රහ යෝගයන් නොතම සාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේගේ කේන්ද්‍රයෙහි යෙදී තිබෙන බැව්ද දත යුත්තේය.

ගුරෝ මූර්චෙ කේන්ද්‍රෙ භවති දානමෙ නවගුරොඃ
ජනුඃ කාලෙමුද්‍රාඃ විලසසි සමුද්‍රා වධිභාසම්
ගුරෝකර්කේචාපෙ භුවතිච චන්ද්‍රෙ දිනමණෝ
බුධෙ තුඞ්ගෙ ලග්නෙ බලවති බගෙවා තර පතිඃ

සඳු ග්‍රහයාඃ සිව්වෙනි රාශියට පැමිණීමත් හා පුරු ග්‍රහ යෝග එකම ගුරු බුධ යන දෙදෙන චන්ද්‍රයාඃ දෘෂ්ටිම කරණ කොට කෙනෙක් උත්පත්තිය හිමක සිදුවන බව ජාතක රත්නයෙහි සඳහන්ම තිබෙන පහත දක්වන

කවියෙන් ප්‍රකාශ වන බව සහ මහ බෝධි සත්වයන්ගේ ජන්ම පත්‍රයෙහි මෙම ග්‍රහ යෝගය යෙදී තිබෙන බවත් එබැවින් බුදුන් වහන්සේගේ බිහි වීම කාලවතෝද්‍යානයෙහිවූ භූමියෙහි සිදුවූ බවත් දත යුත්තේය.

සඳු සිව්වන උපදින කල සිටල ත්
අද මව ගත උන්දෑකා!ත් සිවල ත්
යෙදුනම හේතුව යොගය පාප ත්
වැදුමෙය කිම සංඛක කිය ඒපු ත්

ශනි අටවෙනි රාශියේ එහම් වෘරාශියේ සිටි බැවින් පිටරටකදී මරණය වන බව ජාතික රත්නයෙහි සඳහන්ව තිබෙන පහත පෙනෙන කවියෙන් ප්‍රකාශ වන බව සහ මෙම යෝගයත් බුදුන්ගේ ක්ෂේත්‍රයෙහි යෙදී තිබෙන බවත් ඒ නිසාම බුදුන් වහන්සේගේ කාලක්‍රියාව ජන්ම භූමියෙන් පිටවූ කුසිනාරා නම් නගරයෙහිදී සිදුවූ බවත් දත යුත්තේය.

උනිය අට වර රාශි පර රට නිරවි නම් සිය දේසෙ දී
උහය රුස නම් යෙදෙයි මර සිය පර දේශ දෙක අකර දී
සිටිය නම රිවි දශයෙවත් සිව්වන රුසේ අනහරු යෙ දී
නිතිය නොමහැකි බියෙන් ගල් මුදුනෙන් වැටී මරුමුව ව දී

කටක රාශියේ උත්පැත්තිය කාරණ කොට ගෙන ආයු කෙලවර වන්නාවූ මරණය අජීර්ණ රෝගයකින් වන බව ජාතක රත්නයෙහි ඇතුලත්ව තිබෙන පහත දක්වන කවියෙහි පෙනෙන බව සහ ගෞතම බුදු රජාණන් වහන්සේගේ කාලක්‍රියාව චුන්ද නම් කම්මාර කුල පුත්‍රයා විසින් පිලිගන්වන්නට යෙදුන සූකර මද්දවය සහිත ආහාරය වැලදීමෙන් හටගත් අජීර්ණ රෝගය කාරණ කොට ගෙන නොහොත් ආයු කෙලවරදීවූ මරණයට ආබාධයක් වශයෙන් ඇති වූයේ අජීර්ණ රෝගයක් බවත් දත යුත්තේය.

මෙසයට පිත් උස්න උන බඩ ගිනිගි ගොන් රුස් තිදෙස් රිපුගි නි
දෝස රෝගද මිතුනයට සැඟී සූල කටකෙට අරුචි පිපුමෙ නි
සිහරි පූඩය යෝනි ලෙඩ උන කන් රුසට ලිඟු රුජා පතිත නි
සෙව් එනන්තින් තුලාවට උන රුසලි පාණ්ඩුන් පිලින ගහනී නි

නිමි.

# දීපාලෝක ජ්‍යොතිෂ කාර්යාලය

**ප්‍රසිද්ධ ජ්‍යොතිශාස්ත්‍රාචාර්ය**
**බලංගොඩ ජයසේකර මහතාගේ අනාගත කියුම්**

දිව්‍ය ඥාණයට දෙවැනි ඥාණයක් ඇත්තේ ජ්‍යොතිශාස්ත්‍රඥයාටයි. අපේ අනාගත කියමන්සත්‍ය බව පසක්පාසා නිකුත්වෙන අපේ පලාපල පොත් බලන්නෝ දනිති.

මෙසේ සත්‍ය ප්‍රකාශ කරන්නේ 37 වසක පලපුරු කමින් හා ජ්‍යොතිර්ඥාණයෙනි. ඔබේ කේන්ද්‍ර කොපිය හෝ නිවැරදි උපන් වේලාව එවා 20 වසක සත්‍ය ඵලාඵල ලියා දීමට රු. 8/00

| | |
|---|---|
| මුද්‍රණ පොතක ජීවිතාත්තය දක්වා ඵලාඵල ලියා දීමට | 6/00 |
| අන්තර් දශා අනුව පලාඵල ලියාදීමට | 10/00 |
| ෂඩ් වර්ග කේන්ද්‍රයක් පුස්කොළේ ලියා දීමට | 5/00 |
| කේන්ද්‍ර දෙකක් පොරොන්දම් ලියා එවීමට | 5/00 |
| ඔබගේ අත් අකුරු සහිත අනුමාන වයසද ලියුම ලියන වේලාවද අනුව විස්තරයක් ලියා එවීමට | 600 |
| සාමාන්‍ය විස්තරයකට ශත | 50 |
| මගුල් නැකැත් පත්‍රයක් ලියා දීමට | 10/00 |

මෙසේ ලියුම් එවනු ඒ එච්. ජයසේකර. හපුතලේ පාර – බලන්ගොඩ


සිංහල – දෙමළ – ඉංග්‍රීසි සහ වර්ණ

**සෑම මුද්‍රණ වැඩක් සඳහාද,**

නවීන යන්ත්‍රානුසාරයෙන්
මුද්‍රණාලයන්හි භාරදසි කපන කටර් මැෂින්

**පිහියා මුවහත් තැබීම**

සඳහා ද,

ලිත් කැලැන්ඩර් දින පොත් සහ වෙනත් පොත් වර්ග
ඉතා පහසු මිලට ලබා ගැනීම සඳහාද
පැමිණිය යුතු එකම ස්ථානය

**කැප්ටන් මුද්‍රණාලය**

307/3, පලමුවෙනි මරදාන
කොළඹ.



බලංගොඩ ජ්‍යොතිශාස්ත්‍රාචාර්ය ඒ. එච්. ජයසේකර මහතා විසින් සකස් කර ජේ. ඇම්. බී. පීරිස් වන මා විසින් කොළඹ පලමුවෙනි මරදානේ අංක 307/3 දරණ ස්ථානයේ පිහිටි කැප්ටන් මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.



සබ්බ දානං ධම්ම දානං ජිනාති